වෙළුම 13 | කාණ්ඩය 01 | අගෝස්තු 2024

# පුවත් හසුන

## උක් පර්යේෂණ ආයතනය

# 2004 කාණ්ඩයේ උක් ප්‍රභේද තුනක් වාණිජ වගාව සඳහා නිකුත් කරයි



උක් ප්‍රභේද වාණිජ වගාව සඳහා නිර්දේශ කිරීමේ ක්‍රියාවලිය යටතේ එක් එක් ප්‍රදේශයන්ට උචිත 2004 කාණ්ඩයේ උක් ප්‍රභේද 03ක් වාණිජ වගාව සඳහා හඳුන්වාදීම පසුගියදා උක් පර්යේෂණ ආයතනයේ දී සිදු විය. එහිදී පැල්වත්ත හා හිඟුරාන යන ප්‍රදේශවලට වඩාත් ගැලපෙන උසස් ලක්ෂණ සහිත උක් ප්‍රභේද මෙලෙස වාණිජ වගාව සඳහා හඳුන්වාදීමට පියවර ගැනිණි. පැල්වත්ත ප්‍රදේශය සඳහා එස් එල් 04 164 හා පටක රෝපණය මගින් නිපදවනු ලැබූ එස් එල් ටී 5222 යන ප්‍රභේද නිර්දේශ කළ අතර, හිඟුරාන ප්‍රදේශය සඳහා එස් එල් 04 224 යන ප්‍රභේදය නිර්දේශ කෙරිණි. මෙම ප්‍රභේද තුනෙහිම උක් අස්වැන්නේ සාමාන්‍යය, හෙක්ටයාරයකට ටොන් 100ක් පමණ වන අතර, කළු දුඹුළු රෝගය සඳහා ද ප්‍රතිරෝධී වේ. වාණිජ වගාවන්හි පවත්වා ගත යුතු උක් ප්‍රභේද සංයුතිය ඉහළ දැමීම තුළින් වඩාත් ඵලදායී උක් හා සීනි අස්වැන්නක් ලබා ගැනීමට මෙම නව ප්‍රභේද ඉවහල් වනු ඇත.

# උක් සීනි කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් ඒකාබද්ධ පර්යේෂණ හා තාක්‍ෂණ හුවමාරු වැඩසටහන් රැසක්

දේශීය උක් සීනි කර්මාන්තයේ චිරස්ථායී පැවැත්ම වෙනුවෙන් උක් පර්යේෂණ ආයතනයේ දායකත්වය, සීනි කර්මාන්තායතන වෙත වඩාත් පුළුල් ලෙස ලබා දීම පිළිබඳව සාකච්ඡාවක් උක් පර්යේෂණ ආයතනයේ සභාපති සංජීව කරුණාරත්න, අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරී (වැ.බ) ආචාර්ය චන්ද්‍රජිත් ද සිල්වා, තාක්‍ෂණ හුවමාරු හා සංවර්ධන අංශයේ අංශ ප්‍රධානී ඩී. පී. ඩබ්ලිව්. පොත්තවෙල යන නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් 2024 මැයි 15 දින ලංකා සීනි සමාගමේ පැල්වත්ත ඒකක ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි.



සාකච්ඡාවට සහභාගී වූ පැල්වත්ත ඒකකයේ නිලධාරීන්

මෙම සාකච්ඡාවේ දී ප්‍රධාන කරුණු කිහිපයක් කෙරෙහි අවධානය යොමු විය.

- දැනට පර්යේෂණ අත්හදා බැලීම් සම්පූර්ණ කර ඇති, උක් හා සීනි අස්වැන්න ඉහළ, නව උක් ප්‍රභේද කඩිනමින් වාණිජ වගාව සඳහා නිකුත් කිරීමට පියවර ගැනීම.
- නවීන තාක්‍ෂණික ක්‍රමෝපායන් යොදා ගැනීම මගින් උක් කර්මාන්තයේ නිෂ්පාදන පිරිවැය අවම කිරීම.
- නව තාක්‍ෂණික ක්‍රමවේද හඳුන්වාදීම හා ලාභදායිතාව වැඩි කිරීම තුළින් උක් වගාව සඳහා තරුණ කණ්ඩායම් ආකර්ෂණය කර ගැනීමට කටයුතු කිරීම.
- පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් පර්යේෂණ දැනුම හා එහි භාවිතයන් වැඩි කිරීමට කටයුතු කිරීම.




උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ(වැ.බ.), ආචාර්ය චන්ද්‍රජිත් ද සිල්වා තම අදහස් දක්වමින්

ඉහත කරුණු පිළිබඳව දෙපාර්ශවයේම අවධානය යොමු කිරීමත්, ඊට අදාළ වැඩසටහන් කඩිනමින් දියත් කිරීමටත් මෙම සාකච්ඡාවේ දී තීරණය විය. මේ සඳහා ලංකා සීනි සමාගමේ අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරී (විශ්‍රාමික) මේජර් වජිර කුමාරතුංග මහතා, පැල්වත්ත ඒකකයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී සමන් අමරකෝන් මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් (කෘෂි, කම්හල් හා ස්කාගාර) ඇතුළු පැල්වත්ත ඒකකයේ කළමණාකාරීත්වය හා විවිධ අංශ නියෝජනය කරමින් නිලධාරීන් පිරිසක් සහභාගී විය.

### ඇතුළු පිටු


- උක් පර්යේෂණ ආයතනයට නව සභාපතිවරයෙක් — 02
- ආචාර්ය එම්. එස්. පෙරේරා විශ්‍රාම යාම නිසා පුරප්පාඩු වූ අධ්‍යක්ෂ ධූරයට වැඩ බලන අධ්‍යක්ෂවරයෙක් පත් කෙරේ — 02
- උක් වගාවේ රසායනික වල් මර්දනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් — 02
- කඳන් විදින පණුවා මර්දනයට නව නිර්දේශයක් — 03
- උක් වගාවේ තාක්‍ෂණයන් ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් — 04-05
- බෝග ආරක්‍ෂණ අංශයට ශාක ව්‍යාධිවේදය පිළිබඳ ආචාර්ය උපාධියක් — 06
- 2024 බක්මහ උළෙල සාර්ථකව පවත්වයි — 06
- නැවුම් බවෙන් හැඩවෙන පැල්වත්ත — 07
- 2007 ශ්‍රේණියෙන් ඉහළ සීනි නිෂ්පාදන විභවයක් සහිත උක් ප්‍රභේද 02ක් හඳුනා ගැනේ — 08



සංජීව දමින්ද කරුණාරත්න මහතා

# උක් පර්යේෂණ ආයතනයට නව සභාපතිවරයෙක්

උක් පර්යේෂණ ආයතනය ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතට පත්කර ඇති අතර, එහි අමාත්‍යවරයා ලෙස ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ද ගරු රාජ්‍ය අමාත්‍යවරයා ලෙස දිළුම් අමුණුගම මහතා ද කටයුතු කරනු ලබයි. මෙම වෙනස් වීමෙන් අනතුරුව ගරු ජනාධිපතිතුමා විසින් උක් පර්යේෂණ ආයතනයේ නව සභාපති ලෙස ඊ. සංජීව දමින්ද කරුණාරත්න මහතා 2024.04.09 දින සිට පත්කර තිබේ. වෘත්තියෙන් ඉංජිනේරුවකු වන එතුමා මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධිධරයෙකි.

# ආචාර්ය එම්. එස්. පෙරේරා විශ්‍රාම යාම නිසා පුරප්පාඩු වූ අධ්‍යක්ෂ ධූරයට වැඩ බලන අධ්‍යක්ෂවරයෙක් පත් කෙරේ

උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ලෙස සේවය කළ ආචාර්ය එම්. එස්. පෙරේරා 2024.04.21 දින සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් අනතුරුව පුරප්පාඩු වූ එම තනතුරේ රාජකාරි ආවරණය කිරීමට උක් පර්යේෂණ ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීවරයෙක් ලෙස සේවය කරන ආචාර්ය ඒ. එල්. චන්ද්‍රජිත් ද සිල්වා වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කර ඇත. චන්ද්‍රජිත් ද සිල්වා මහතා සිය මූලික උපාධිය රුහුණ විශ්වවිද්‍යාලයෙන්ද, දර්ශනපති හා දර්ශනශූරී යන



ආචාර්ය ඒ එල් සී ද සිල්වා

උපාධි පේරාදෙණිය කෘෂිකර්ම පශ්චාත් උපාධි අධ්‍යයන ආයතයෙන් හිමිකරගෙන ඇත. චන්ද්‍රජිත් ද සිල්වා මහතා උක් පර්යේෂණ ආයතනයේ සේවයට එක් වන්නේ 1997 වර්ෂයේ පර්යේෂණ නිලධාරී වරයෙක් ලෙස වන අතර, 2020 ඔක්තෝබර් මාසයේ සිට ආයතනයේ වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ, තාක්ෂණ හුවමාරු හා සංවර්ධන) ලෙස ද කටයුතු කරනු ලැබීය.

# උක් වගාවේ රසායනික වල් මර්දනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක්

අමිල ප්‍රසාද් කරුණාතිලක



පැල්වත්ත ඒකකයේ වගා අංශයේ නිලධාරීන් දැනුවත් කරමින්



සෙවනගල ඒකකයේ වගා අංශයේ නිලධාරීන් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට එක්වෙමින්



සෙවනගල ප්‍රදේශයේ ගොවීන්ට ප්‍රායෝගික පුහුණුව ලබා දෙමින්

වර්තමානය වන විට උක් වගාකරන ප්‍රදේශයන්හි වල් මර්දනය කිරීම තරමක් ගැටලුකාරී තත්වයකට මුහුණ පා ඇත. විශේෂයෙන් ක්ෂේත්‍රයේ ඇති වල් පැළ හඳුනා ගැනීම, ඒවා මර්දනයට සුදුසු වල් නාශක තෝරා ගැනීම මෙන්ම එම වල් නාශක වඩා නිවැරදි ආකාරයෙන් ක්ෂේත්‍රයට යෙදීම වැනි ඉතා වැදගත් කාරණා පිළිබඳ වැඩි අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් වල් මර්දනය කිරීම මෙලෙස අසීරු කටයුත්තක් වී තිබේ. එබැවින් මේ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකරමින් ක්ෂේත්‍රයේ වල් පාලනය මනාව සිදු කිරීමට හැකිවන අයුරින් කර්මාන්තායතනවල නිලධාරීන් හා ගොවීන් වෙත රසායනික වල් මර්දනය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩමුළු කිහිපයක් තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය හා ලංකා සීනි සමාගම එක්ව සංවිධානය කෙරිණි. ඉන් පළමුවැන්න පැල්වත්ත ඒකකයේ වගා අංශයේ නිලධාරීන් වෙනුවෙන් පැවැති අතර, දෙවැනි හා තෙවැනි වැඩමුළු සෙවනගල ඒකකයේ වගා අංශයේ නිලධාරීන් හා සෙවනගල ප්‍රදේශයේ ගොවීන් කණ්ඩායමක් වෙනුවෙන් පැවැත්විණි. බෝග හා සම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ නිලධාරී අමිල චතුරංග මහතා විසින් මෙම වැඩමුළු සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

# කඳන් විදින පණුවා මර්දනයට නව නිර්දේශයක්

ආචාර්ය ගයානි චංචලා - පර්යේෂණ නිලධාරී
සුනේත්‍රා වනසිංහ - පර්යේෂණ නිලධාරී

උක් වගාවට හානිකරන ප්‍රධාන පළිබෝධකයෙක් ලෙස කඳන් විදින පණුවන් හැඳින්විය හැකිය. කඳන් විදින පණුවාගේ හානිය හේතුවෙන් උක් දඬුවල පමණක් නොව උක් යුෂයෙහි ගුණාත්මය ද අඩු වේ.


උක් ශාකයේ කඳන් විදින පණුවාගේ හානිය නිරීක්ෂණය වන ආකාරය


කඳන් විදින පණුවා උක් ශාක කඳ ආහාරයට ගනිමින්

**රසායනිකය නිර්දේශිත සංයුතිය යෙදීමෙන් පිරිවැය ප්‍රතිලාභ අනුපාතය පැළ වගාවේ 1.14ක් හා නිරි වගාවේ 7.08ක් ලෙසත් ඉහළ නංවා ගත හැකි බවත් තහවුරු කර ඇත.**

එපමණක් නොව බීජ උක් දඬුවල ප්‍රරෝහණ හැකියාව ද සැළකිය යුතු මට්ටමකින් අඩු කිරීමට මෙම හානිය හේතුවක් වේ.
වර්තමානය වන විට උක් වගාවන්හි කඳන් විදින පණුවාගේ හානිය ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින බව නිරීක්ෂණය වන අතර, පෙර යොදන ලද රසායනික නිර්දේශයන් සඳහා මෙම පණුවන් දක්වන ප්‍රතිචාරය ද අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය වී ඇත.


කඳන් විදින පණුවාගේ හානියට ලක්වූ උක් ශාක කඳේ ඇතුළත පෙනුම


රසායනික ද්‍රව්‍ය ක්ෂේත්‍රයට යෙදීම

එබැවින්, මෙම පළිබෝධකයාගේ ගහනය ආර්ථික හානිදායක මට්ටමට ළං නොවන සේ තබා ගැනීම සඳහා නව රසායනික නිර්දේශ පිළිබඳව අධ්‍යයනයන් උක් පර්යේෂණ ආයතනයේ බෝග ආරක්ෂණ අංශය මගින් අඛණ්ඩව සිදු කරමින් පවතී.

එහිදී ක්ලෝරැන්ට්‍රැනිලිප්‍රෝල් (Chlorantraniliprole) 0.4% (w/w) G යන කෘමිනාශක කැට, කඳන් විදින පණුවා සාර්ථකව මර්දනය කිරීමට භාවිතා කළ හැකි බව තහවුරු විය. මෙයට අදාළ ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතු සියඹලාණ්ඩුව ප්‍රදේශයේ දී සිදු කළ අතර, Chlorantraniliprole 0.4% (w/w) G කෘමි නාශකය එක් වරකට හෙක්ටයාරයකට කිලෝ 14ක් බැගින්, දින 55 කාල පරතරයකින් මාස 5 1/2 වනතුරු යෙදීමෙන් මෙම කඳන් විදින පණුවාගේ හානිය අවම කරගත හැකි බව තහවුරු විය.

මෙම රසායනිකය ශාකයේ වර්ධන සාධකයන්ට ද (දිග, බර සහ කඳේ වට ප්‍රමාණය) සීනි සංයුතියට ද බලපෑමක් සිදු නොකරන බව ද පළිබෝධ ගහනය අඩු වීම හේතුවෙන් උක් යුෂයෙහි ගුණාත්මය වැඩි කරන බව ද තව දුරටත් තහවුරු කර ගන්නා ලදී.




## නව නිර්දේශය:

**රසායනිකය:**
ක්ලෝරැන්ට්‍රැනිලිප්‍රෝල් (Chlorantraniliprole) 0.4% (w/w) G

**යෙදුම් ස්වභාවය:**
පාංශු කලාපයට යෙදීම

**යෙදුම් අනුපාතය:**
හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 14

**යොදන ක්‍රමය:**
මුල පද්ධතිය ආසන්නයට

**යොදන කාල පරතරය:**
මුලින්ම බීජ උක් සිටුවීමේ දී මූලික පොහොර සමග මිශ්‍රකර යොදන්න. අනතුරුව වගාවට මාස 5 1/2 වන තෙක් (දින 55ක කාල පරාසයන්ගෙන්) 4 වරක් වගාවට යොදා පස්වලින් ආවරණය කරන්න.

# උක් වගාවේ තාක්ෂණය ව්‍යාප්ත කිරීමේ වැඩසටහන්

## පැල්වත්ත



2024.02.15 දින උල්කන්ද විහාරස්ථානයේ පැවති පුහුණුවට ගොවීන් එක්වෙමින්



2024.05.21 දින ඇතිලිවැව ආකර්ෂි හෝටල් පරිශ්‍රයේ පැවති පුහුණුවට ගොවීන් එක්වෙමින්

**උක් වගාවේ නිවැරදි කළමනාකරණ ක්‍රම භාවිතයෙන් ලාභදායිතාව වැඩිකර ගැනීම සම්බන්ධ ගොවි පුහුණු වැඩසටහන් මාලාවක් ලංකා සීනි සමාගමේ වැල්ලවාය අධිකාරි කාර්යාලය හා තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය එක්ව සංවිධානය කරයි.**

උක් වගාවේ නිවැරදි කළමනාකරණ ක්‍රම භාවිතයෙන් ලාභදායිතාව වැඩිකර ගැනීම සම්බන්ධ ගොවි පුහුණු වැඩසටහන් මාලාවක් ලංකා සීනි සමාගමේ වැල්ලවාය අධිකාරි කාර්යාලය හා තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය එක්ව සංවිධානය කෙරිණි. මේ යටතේ වැල්ලවාය වරුණගම යුධ හමුදා කඳවුර, උල්කන්ද විහාරස්ථානය, ගල්පොත්තආර ප්‍රජා ශාලාව හා ඇතිලිවැව ආකර්ෂි හෝටල් පරිශ්‍රය යන ස්ථානයන්හි දී මෙම පුහුණු වැඩසටහන් පැවැත්විණි. මීට අමතරව පැල්වත්ත ජනාවාස 09 කාර්යාලය මගින් ද මෙවැනි පුහුණු වැඩසටහනක් පැවැත්වීමට ද පියවර ගන්නා ලදී. ගොවි පුහුණු වැඩසටහන් සඳහා පැල්වත්ත ඒකකයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ජ්‍යෙෂ්ඨ ශෂ්‍ය විද්‍යාඥ, පිටස්තර ගොවි කළමණාකාර, වැල්ලවාය හා ජනාවාස 09 අධිකාරි කාර්යාලවල ජ්‍යෙෂ්ඨ වතු අධිකාරීවරුන්, සහකාර අධිකාරීවරුන් ඇතුළු නිලධාරීන් සහභාගී වූ අතර, උක් පර්යේෂණ ආයතනයේ තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශයේ නිලධාරීන් විසින් වැඩසටහන් මෙහෙයවූහ. මෙම වැඩසටහන් සංවිධානය කිරීමට මූලිකත්වය ගෙන ක්‍රියා කළ 2024 මාර්තු 24 දින සේවයෙන් විශ්‍රාම ගන්නා ලද වැල්ලවාය පිටස්තර ගොවි කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ වතු අධිකාරී එස්. එම්. මද්දුමබණ්ඩාර මහතාට විශේෂ ස්තුතියක් පුදකර සිටින්නෙමු.



2024.03.26 දින ගල්ඔය වැවිලි සමාගමේ පිටස්තර ගොවි කර්යාලවල ජංගම මෘදුකාංගය ප්‍රචලිත කිරීමට අදාළ පෝස්ටරය ප්‍රදර්ශනය කරමින්

### උක් සවිය ජංගම මෘදුකාංගය ප්‍රචලිත කිරීම

උක් වගාව ආශ්‍රිත දත්ත හා තොරතුරු ජනතාව වෙත ඉතා කඩිනමින් ලබා ගැනීම වෙනුවෙන් උක් පර්යේෂණ ආයතනයේ බෝග පෝෂණ අංශයේ පර්යේෂණ නිලධාරී ළහිරු කුමාරසිරි මහතා විසින් නිර්මාණය කරන ලද උක් සවිය ජංගම මෘදුකාංගය ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් 2024 මාර්තු 25 හා 26 යන දිනවල දී වැල්ලවාය, පැල්වත්ත, බුත්තල, සියඹලාණ්ඩුව, ඇතිමලේ හා හිඟුරාන යන ප්‍රදේශ ආවරණය කරමින් පැවැත්විණි. මේ යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් හා පෝස්ටර් ප්‍රදර්ශනය කිරීමක් සිදු විය. එමෙන්ම පැල්වත්ත, ඇතිමලේ හා ගල්ඔය යන සීනි සමාගම්වල නිලධාරීන් දැනුවත් කිරීමටත් ඔවුන්ගේ ප්‍රාදේශීය කාර්යාලවල අදාළ පෝස්ටරය ප්‍රදර්ශනය කිරීමටත් පියවර ගැනිණ.

07 පිටුවට




ගල්ඔය වැවිලි සමාගමේ වගා අංශයේ නිලධාරීන් දැනුවත් කරමින්

2024 ජූනි 26 දින ගල්ඔය වැවිලි සමාගමේ නිලධාරීන් වෙනුවෙන් උක් වගාවේ වල් මර්දනය පිළිබඳ අධ්‍යාපනික වැඩමුළුවක් එම ආයතන පරිශ්‍රයේ දී පැවැත්විණි. වඩාත් නිවැරදි ආකාරයෙන් කාර්යක්ෂමව වල් මර්දනය කිරීමට අවශ්‍යය දැනුම ලබා දීම මෙම වැඩසටහනේ අරමුණ විය. හිඟුරාන උක් සංවර්ධන නිලධාරී මධුරංග සම්පත් වේරගොඩ මහතා, ගල්ඔය වැවිලි සමාගම හා එක්ව මෙම වැඩමුළුව සංවිධානය කළ අතර, උක් පර්යේෂණ ආයතනයේ බෝග හා සම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ නිලධාරී අමිල චතුරංග මහතා විසින් සම්පත් දායකත්වය ලබා දී ඇත.



2024.01.05 දින වයඹ විශ්වවිද්‍යාලයේ සිසුන් ගොවිපොළ යාන්ත්‍රීකරණය පිළිබඳ ප්‍රායෝගික සැසියකට එක්වෙමින්



2024.05.06 දින කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යායතනයේ සිසුන් තවාන් පාලනය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවට එක්වෙමින්

### විශ්වවිද්‍යාල සිසුන් සඳහා වැඩසටහන් - උඩවලව උක් පර්යේෂණ ආයතනය

2024.01.05 දින වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ තෙවෙනි වසර සිසුන් කණ්ඩායමක් හා 2024.05.06 දින කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යායතනයේ තෙවෙනි වසර සිසුන් කණ්ඩායමක් වෙනුවෙන් අධ්‍යාපනික වැඩසටහන් දෙකක් පැවැත්විණි. මෙම වැඩසටහන්වල දී උක් වගාවේ බිම් සැකසීම, තවාන් පාලනය, බීජ සිටුවීම, ශෂ්‍ය විද්‍යාත්මක මූලධර්ම, රෝග හා පළිබෝධ පාලනය, යාන්ත්‍රීකරණ තාක්ෂණය මෙන්ම සැකසුම් තාක්ෂණය සම්බන්ධයෙන් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දීමට කටයුතු යොදා තිබූ අතර, තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය, අනෙක් පර්යේෂණ අංශ සමග එක්ව ඉතා සාර්ථකව මෙම වැඩසටහන් පැවැත්වීමට පියවර ගැනිණ.



ඇතිමලේ පුද්ගලික වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීතුමන් විසින් පැමිණ සිටින ගොවීන් දැනුවත් කරමින්

ඇතිමලේ පුද්ගලික වැවිලි සමාගම වෙත තම උක් අස්වැන්න සපයන ගොවි ප්‍රජාව වෙනුවෙන් උක් වගාවේ නිවැරදි ශෂ්‍ය විද්‍යාත්මක මූලධර්ම යොදා ගනිමින් වියදම් අඩුකර ආදායම ඉහළ නංවා ගන්නා ආකාරය පිළිබඳ පුහුණු වැඩ සටහන් කිහිපයක් පැවැත්විණි. මෙම වැඩසටහන් ඇතිමලේ පුද්ගලික වැවිලි සමාගම විසින් සංවිධානය කරන ලද අතර, ඒ සඳහා සම්පත් දායකත්වය උක් පර්යේෂණ ආයතනයේ සියඹලාණ්ඩුව සංවර්ධන නිලධාරී රසික ප්‍රභාත් මහතා විසින් ලබා දෙන ලදී. මෙම වැඩසටහන් සඳහා ඇතිමලේ වැවිලි පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරුන්, ශෂ්‍ය විද්‍යාඥ හා වතු අධිකාරීවරුන් ඇතුළු නිලධාරීන් පිරිසක් ද එක් විය.

# බෝග ආරක්ෂණ අංශයට ශාක ව්‍යාධිවේදය පිළිබඳ ආචාර්ය උපාධියක්



ආචාර්ය සුමේධා තුෂාරි

බෝග ආරක්ෂණ අංශයේ ව්‍යාධි විද්‍යාව පිළිබඳ පර්යේෂණ නිලධාරී ලෙස සේවය කරන ඒ. එන්. ඩබ්ලිව්. සුමේධා තුෂාරි මහත්මිය 2023 දෙසැම්බර් මාසයේ දී අණුක ජීව විද්‍යාව හා ව්‍යාවහාරික ක්ෂුද්‍ර ජීව විද්‍යාව පදනම් කර ගනිමින් ශාක ව්‍යාධි විද්‍යාව පිළිබඳ සිය ආචාර්ය උපාධිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයෙන් ලබා ගැනීමට සමත් වී ඇත. සිය ආචාර්ය උපාධිය සඳහා උක් වගාවට වැලඳෙන ප්‍රධාන රෝගයක් වන කළු දුඹුලු රෝගය (Smut) ඒකාබද්ධ කළමනාකරණය පිළිබඳ අධ්‍යයනයක් සිදු කර ඇත. කළු දුඹුළු රෝගයට ප්‍රතිරෝධී ප්‍රභේද නිපදවීම සඳහා උක් ජාන ප්ලාස්මයෙන් ප්‍රතිරෝධී දෙමව්පියන් හඳුනා ගැනීම, ප්‍රතිරෝධී ප්‍රභේද කල්තියා හඳුනා ගැනීමට රූප විද්‍යාත්මක හා ජෛව විද්‍යාත්මක නිර්ණායක නිර්ණය කිරීම, ව්‍යාධිජනකයාගේ රූප විද්‍යාත්මක හා ප්‍රවේණික විචලනය අධ්‍යයනය කිරීම, රෝගය මර්දනයට රසායනික ද්‍රව්‍ය හඳුනා ගැනීම, ප්‍රතිරෝධී ප්‍රභේද කල්තියා හඳුනා ගැනීම සඳහා ජාන ප්‍රකාශනය උපයෝගී කර ගනිමින් ක්‍රමවේදයක් සකස් කිරීම ආදී කරුණු රාශියක් අධ්‍යයනය කරමින් ඒකාබද්ධ කළමනාකරණ වැඩසටහන සකස්කර ඇත. මෙම අධ්‍යයනයේ දී සොයාගත් නව දැනුම ආයතනයේ පර්යේෂණ වැඩසටහන් සඳහා ද යොදා ගන්නා අතරම, එම පර්යේෂණ දත්ත පදනම් කර ගනිමින් ජාත්‍යන්තරව පිළිගත් ප්‍රධාන පර්යේෂණ සඟරා කිහිපයකම පර්යේෂණ පත්‍රිකා රාශියක්ම පළ කිරීමට ද ඇය සමත්වී ඇත.

# 2024 අවුරුදු උළෙල සාර්ථකව පවත්වයි




උක් පර්යේෂණ ආයතනයේ සභාපතිතුමන් මැරතන් ධාවන තරගය ආරම්භ කිරීමට විධානය ලබා දෙමින්

උක් පර්යේෂණ ආයතනයීය සේවක සුබසාධක සංගමය මගින් වාර්ෂිකව පවත්වනු ලබන අවුරුදු උළෙල මෙවරත් විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් ඉතා සාර්ථකව ආයතනයීය ක්‍රීඩා පිටියේ දී පැවැත්විණි. අවුරුදු ක්‍රීඩා රාශියකින් සමන්විත වූ 2024 අවුරුදු උළෙලේ, වැඩිහිටියන් සඳහා පමණක් නොව ළමුන් හා කුඩා දරුවන් වෙනුවෙන් ද තරඟ පැවැත්වීමට සංවිධායක මණ්ඩලය පියවර ගෙන තිබිණි. මැරතන් ධාවන තරඟය, වාසනා මුට්ටිය බිඳීම, බෝතලයට වතුර පිරවීම, කඹ ඇදීම, පොල් ගෑම, අලියට ඇස තැබීම, දිවීමේ තරඟ, සංගීතයට අනුව තොප්පි මාරු කිරීම, සැඟවුණු මල අනුමාන කිරීම, ගස්ලබු ගෙඩියේ ඇට අනුමාන කිරීම, හැන්ද මත දෙහි ගෙඩිය තබාගෙන දිවීම, බැලුම් පිපිරවීම, සෙමින් බයිසිකලය ධාවනය කිරීම, දවසේ වාසනාවන්තයා, මෙන්ම අවුරුදු කුමර කුමරියන් තේරීම, ඉදිකටුවට නූල ඇමිණීම ඇතුළු තරඟ රාශියකින් අලුත් අවුරුදු උළෙල වර්ණවත් විය. එමෙන්ම සැඳෑ කාලයේ සිට රාත්‍රිය පුරාම සංගීතයෙන් රසවත් වීමට ද උක් පර්යේෂණ ආයතනයේ කාර්ය මණ්ඩලයට අවස්ථාව උදාකර දී තිබුණි.



බෝතලයට වතුර පිරවීමට තරඟකරුවන් එක්වෙමින්

මෙමගින් උක් පර්යේෂණ ආයතනයේ සියලු සේවකයන් අතර ඇති සහයෝගීතාවය තවදුරටත් වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන අලුත් අවුරුදු උළෙල වාර්ෂිකව පැවැත්වීමට කටයුතු කරනු ලබන අතර, සේවක සුබසාධක සංගමයේ වර්තමාන ගරු සභාපති ඩී. පී. ඩබ්ලිව්. පොත්තවෙල මහතා, ගරු ලේකම් සමීර මධුශංක මහතා, ගරු භාණ්ඩාගාරික ශ්‍රීමාල් මහතා හා හිටපු ලේකම් පී. සෝමවීර මහතා ඇතුළු නිලධාරී මණ්ඩලයේ දැඩි කැපවීම මත, 2024 අවුරුදු උළෙල ඉතා සාර්ථකව පැවැත්වීමට හැකියාව ලැබිණි.

# නැවුම් බවෙන් හැඩවෙන පැල්වත්ත





සමන් අමරකෝන්
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී
ලංකා සීනි සමාගම - පැල්වත්ත ඒකකය

ශ්‍රී ලංකා රජයේ ප්‍රධාන සමාගම් අතර, සුවිශේෂී වූ සමාගමක් ලෙස ලංකා සීනි සමාගම හඳුන්වාදිය හැකිය. සෙවනගල හා පැල්වත්ත ලෙස ඒකකයන් දෙකකින් සමන්විත වන ලංකා සීනි සමාගමේ ප්‍රධාන නිපැයුම වන දුඹුරු සීනි නිෂ්පාදනයට අමතරව, වර්තමානයේ ඉතාමත් සුවිශේෂී වූ ව්‍යාපාර ගණනාවක් සිදු කරමින් සිටින අතර, ඒ පිළිබඳ විස්තර ලබාදීම මෙම ලිපියේ අරමුණ වේ.

## 01. උමා ඔයෙන් - පැල්වත්තට වාරි ව්‍යාපෘතිය

ලංකා සීනි සමාගම සතු ජනාවාස උක් ගොවිබිම් මූලික කර ගනිමින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා එක්ව උමා ඔයේ අතිරික්ත ජලය ලබාගෙන ක්‍රියාත්මකවන වාරි ව්‍යාපෘතියක් ලෙස මෙය හැඳින්විය හැකිය. වසර 40ක් පුරාවටම වැසි ජලයෙන් පමණක් උක් වගාව කරනු ලැබූ උක් ගොවි බිම් හෙක්ටයාර 1,500ක් සඳහා අවශ්‍යය අක්කර අඩි 11,000ක පමණ වාර්ෂික වාරි ජල ධරිතාවක් ලබා ගැනීම මෙහි මූලික අරමුණ වේ. මේ සඳහා ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 500ක් වන අතර, එම සියලු වියදම් පැල්වත්ත ඒකකය මගින් දරනු ලැබේ. මේ යටතේ උක් ගොවීන් දහසකට පමණ ප්‍රතිලාභ ලැබෙන අතර, එමගින් වාර්ෂිකව උක් දඬු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 75,000, සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 6,000 සහ එතනෝල් නිෂ්පාදනය ලීටර් 875,000 ප්‍රමාණවලින් ඉහළ නංවා ගැනීමට සැලසුම්කර ඇති අතර, එමගින් ජනාවාස උක් ගොවි ප්‍රජාවගේ ජීවන තත්වය ඉහළ නැංවීමටත් අපේක්ෂා කෙරේ.

## 02. සූර්ය පැනල ව්‍යාපෘතිය

ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වන තිරසාර සංවර්ධන අභිමතාර්ථ මුදුන් පමුණුවා ගැනීමේ අභිලාශයෙන් ලාංකීය රජයේ තිරසාර සංවර්ධන ප්‍රතිපත්තීන්ට පිටු බලයක් වෙමින් පුනර්ජනනීය බලශක්ති මූලයක් ලෙස සූර්ය බලය උපයෝගී කර ගනිමින් අප ආයතනයට අවශ්‍යය විදුලිය නිෂ්පාදනය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු වේ. වර්ග මීටර් 6,000ක පමණ පරාසයක පැතිරී ඇති සූර්ය පැනල මගින් මෙගා වොට් එකක විදුලි ජනනය කිරීමක් සිදුවන අතර, මසකට විදුලි ඒකක 140,000ක ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට මෙමගින් හැකියාව ලැබේ. මෙම ව්‍යාපාතියට රුපියල් මිලියන 177ක් වැය වුවත්, විදුලිය සඳහා එක් මසකට වැයවන රුපියල් මිලියන 13ක පමණ ප්‍රමාණය ඉතිරි කර ගැනීමටත් පුනර්ජනනීය බලශක්ති මූලයන් ප්‍රචලිත කර ගැනීමටත් මෙම ව්‍යාපෘතිය හරහා හැකියාව ලැබෙනු ඇත.

## 03. සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය

ලංකා සීනි සමාගමේ පැල්වත්ත ඒකකය ඉතාමත් සුන්දර රමණීය පරිසරයක ස්ථානගත වී ඇති බැවින්, වර්තමානයේ සංචාරක ආකර්ශනය දිනා ගැනීමට සමත්ව ඇත. සංචාරක ආගන්තුක නිවාසය අපගේ ප්‍රධාන සංචාරක නැවතුම්පොළ වන අතර, එය නවීන සුවපහසු කාමර, පිහිනුම් තටාකයක් හා ක්‍රීඩා අංගනයන් සහිත නවීන පහසුකම්වලින් සමන්විත වේ. එමෙන්ම ඉතා ප්‍රණීත දේශීය මෙන්ම විදේශීය ආහාර පානවල රසය විඳීමටත් හැකියාව ඇත. කෘෂිකාර්මික සංචරණය මූලික කර ගනිමින් ත්‍රාසජනක සංචරණය මෙන්ම ස්වභාවික සංචරණ ප්‍රවර්ධනය කිරීමටත් අපේක්ෂා කරන අතර, ලේක් රිසෝට් හා ඉහළ මැණික් වැව යන ආකර්ෂණීය ස්ථාන මූලික කර ගනිමින් ඒ සඳහා කටයුතු කරනු ලැබේ. මෙම ස්ථාන දෙස් විදෙස් සංචාරකයන්ට ඉතා පහසුවෙන් වෙන් කරවා ගැනීමට මෙන්ම බැංකු කාඩ්පත් මගින් ගෙවීමේ පහසුකම් ද සලසා ඇත. “ Leisure Pelwatta” අපගේ මුහුණු පොත් පිටුව හරහා ඉදිරියේ දී එළිදැක්වීමට නියමිත නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ඉතා පහසුවෙන් මෙම සංචාරක පාරාදීසය පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීමටත්, සංචාර පහසුවෙන් වෙන්කර ගැනීමටත් හැකියාව ලැබෙනු ඇත.



05 පිටුවෙන්



ප්‍රදර්ශන කුටිය නැරඹීමට පැමිණි පාසල් සිසුන් හා ව්‍යාවසායකයන්ට තොරතුරු ලබා දෙමින්

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් සංවිධානය කරන ලද අධ්‍යාපනික ප්‍රදර්ශනයක් 2024 මාර්තු 28 දින අතුරුගිරිය එම ආයතන පරිශ්‍රයේ දී පැවැත්විණි. කෘෂිකර්ම ක්ෂේත්‍රය නියෝජනය කරමින් රාජ්‍ය හා පුද්ගලික ආයතන කිහිපයකින්ම ප්‍රදර්ශන කුටි එක්කර තිබූ අතර, උක් පර්යේෂණ ආයතනයේ ප්‍රදර්ශන කුටියකින්ද මේ සඳහා දායකත්වය ලබා දීමට පියවර ගැනිණි.



සැකසුම් තාක්ෂණ අංශයේ නිලධාරීන් විසින් අදාළ පුහුණුව ලබා දෙමින්

ව්‍යාවසායකයින් පිරිසක් වෙනුවෙන් උක් හකුරු හා උක් පැණි නිෂ්පාදනය සම්බන්ධ පුහුණු වැඩසටහනක් උක් පර්යේෂණ ආයතනයේ දී පැවැත්විණි. මේ සඳහා ව්‍යාවසායකයින් හත් දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් සහභාගී විය. සැකසුම් තාක්ෂණ අංශය විසින් අදාළ පුහුණුව ලබා දෙන ලද අතර, තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය විසින් වැඩසටහන සංවිධානය කරන ලදී.

# 2007 ශ්‍රේණියෙන් ඉහළ සීනි නිෂ්පාදන විභවයක් සහිත උක් ප්‍රභේද දෙකක් හඳුනා ගැනේ

අමිල චතුරංග - පර්යේෂණ නිලධාරී
මාලිකා පෙරේරා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
කමල් වික්‍රමසිංහ - පර්යේෂණ නිලධාරී
ආලෝකා මාරලන්ද - පර්යේෂණ නිලධාරී

උක් වගාව සඳහා නව ප්‍රභේද හඳුන්වාදීමේ වැඩසටහන යටතේ මේ වන විට අවසන් අදියරේ පසුවන 2007 ශ්‍රේණියේ එස් එල් 07 3498 සහ එස් එල් 07 3505 යන නව උක් ප්‍රභේදවල සීනි නිෂ්පාදන විභවය පැල්වත්ත සීනි කර්මාන්තායතනය තුළ දී 2024 මාර්තු මාසයේ ඇගයීමට ලක් කෙරිණි. එහිදී සම්මත ප්‍රභේදය (Standard Variety) ලෙස කලාපයේ බහුලව වගා කරනු ලබන එස් එල් 96 128 භාවිතා කර ඇත. මෙම අධ්‍යනය සඳහා පළමුව අදාළ ප්‍රභේදවල මූලික තවාන් ස්ථාපිත කර ගුණනය සිදු කළ අතර, දෙවනුව එම බීජ උක් භාවිතයෙන් අක්කර දෙකක පමණ වාණිජ වගාවක් ස්ථාපිත කරන ලදී. වගාවට මාස 12ක් සම්පූර්ණ වූ පසු උක් අස්වැන්න නෙළීමට පියවර ගැනිණ. එක් ප්‍රභේදයකින් උක් දඬු මෙට්‍රික් ටොන් 60ක් පමණ කර්මාන්තශාලාව තුළ ඇඹරීමෙන් අදාළ ප්‍රභේදයන්හි ඇඹරීමට පෙර උක් දඬුවල පවතින පෝල් ප්‍රතිශතය (Pol % cane), පළමු ඇඹරුම් යන්ත්‍රය මගින් උකහා ගන්නා ලද උක් යුෂය (FEJ), අවසන් ඇඹරුම් යන්ත්‍රය මගින් උකහා ගන්නා ලද උක් යුෂය (LEJ) සහ මිශ්‍ර යුෂයෙහි (Mixed Juice) ගුණාත්මය, එනම් බ්‍රික්ස් ප්‍රතිශතය (Brix %), පෝල් ප්‍රතිශතය (Pol %) සහ සංශුද්ධතාව (Purity %) යන පරාමිතීන් පරීක්ෂාවට ලක් කරන ලදී.

**වගුව 1: කර්මාන්ත ශාලාවේ දී නව ප්‍රභේදවල උක් උෂයේ පරාමිතීන්**

| ප්‍රභේදය | පළමු ඇඹරුම් යන්ත්‍රය මගින් උකහා ගන්නා ලද උක් යුෂය (FEJ) | | | මිශ්‍ර යුෂය (Mixed Juice) | | | අවසන් ඇඹරුම් යන්ත්‍රය මගින් උකහා ගන්නා ලද උක් යුෂය (LEJ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | බ්‍රික්ස් ප්‍රතිශතය | පෝල් ප්‍රතිශතය | සංශුද්ධතාව | බ්‍රික්ස් ප්‍රතිශතය | පෝල් ප්‍රතිශතය | සංශුද්ධතාව | බ්‍රික්ස් ප්‍රතිශතය | පෝල් ප්‍රතිශතය | සංශුද්ධතාව |
| එස් එල් 07 3498 | 18.48 | 15.30 | 82.81 | 13.44 | 13.64 | 80.27 | 4.42 | 4.82 | 73.14 |
| එස් එල් 07 3505 | 18.02 | 14.77 | 81.98 | 13.64 | 12.85 | 78.75 | 4.82 | 4.08 | 72.97 |
| එස් එල් 96 128 | 16.75 | 13.45 | 80.28 | 12.85 | 10.02 | 77.98 | 4.08 | 2.91 | 71.32 |

පරීක්ෂා කරන ලද එස් එල් 07 3498, එස් එල් 07 3505 සහ එස් එල් 96 128 යන ප්‍රභේදවල උක් දඬු අස්වැන්න පැල්වත්ත වගා තත්වයන් යටතේ පිළිවෙලින් හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 82, 87 සහ 80 ලෙස වාර්තා විය. තවද එස් එල් 07 3498 සහ එස් එල් 07 3505 යන ප්‍රභේද දෙකම,සම්මත ප්‍රභේදය වන එස් එල් 96 128 ප්‍රභේදයට සාපේක්ෂව ඉහළ සිනි ප්‍රතිශතයක් ඇති බව සංඛ්‍යාන විද්‍යාත්මකව තහවුරු කෙරිණ.

එස් එල් 07 3498 ප්‍රභේදයේ උක් දඬුවල ආරම්භක පොල් ප්‍රතිශත අගය 12.62ක් හා එස් එල් 07 3505 ප්‍රභේදයේ උක් දඬුවල ආරම්භක පොල් ප්‍රතිශත අගය 12.58ක් හා සම්මත ප්‍රභේදය වන එස් එල් 96 128 ප්‍රභේදයේ එම අගය 11.74ක් ද විය. තවද එම නව ප්‍රභේදවල පළමු ඇඹරුම් යන්ත්‍රය මගින් උකහා ගන්නා ලද උක් යුෂය (FEJ) සහ මිශ්‍ර යුෂයෙහි (Mixed Juice) බ්‍රික්ස් ප්‍රතිශතය (Brix %), පෝල් ප්‍රතිශතය (Pol %) සහ සංශුද්ධතාව (Purity %) යන පරාමිතීන් සම්මත ප්‍රභේදය වන එස් එල් 96 128 ට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා බව සංඛ්‍යාන විද්‍යාත්මකව තහවුරු විය (වගුව - 01).

**වගුව 2: ප්‍රභේදවල පෝල් ප්‍රතිශතයන් හා ඇස්තමේන්තුගත සීනි උකහා ගැනීමේ ප්‍රතිශතයන්**

| ප්‍රභේදය | පෝල් ප්‍රතිශතය | ඇස්තමේන්තුගත සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය (Sugar Recovery) |
|---|---|---|
| SL 07 3498 | 12.62 | 9.62 |
| SL 07 3505 | 12.58 | 9.58 |
| SL 96 128 | 11.74 | 8.74 |

අධ්‍යනයේ දී පරීක්ෂා කරන ලද පරාමිතීන්ට අනුව 2007 ශ්‍රේණියේ එස් එල් 07 3498 සහ එස් එල් 07 3505 යන නව උක් ප්‍රභේද සම්මත ප්‍රභේදය වන එස් එල් 96 128 ප්‍රභේදයට සාපේක්ෂව ඉහළ සීනි නිෂ්පාදන විභවයක් ඇති බව තහවුරු විය. මෙම දත්ත පදනම් කර ගනිමින් එම නව උක් ප්‍රභේද ඉදිරි කාලයේ දී වාණිජ වගා බිම් සඳහා නිදහස් කිරීමට හැකියාව ලැබෙනු ඇත.



**උපදේශකත්වය**
ඊ. සංජීව දමින්ද කරුණාරත්න - සභාපති
ආචාර්ය ඒ. එල්. සී. ද සිල්වා - අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (වැ.බ.)

**සංස්කාරක මණ්ඩලය**
ඩී. පී. ඩබ්ලිව්. පොත්තවෙල - තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී
කේ. ඒ. දිනේශ් කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
ආචාර්ය එල්. එම්. ජේ. ආර්. විජයවර්ධන - පර්යේෂණ නිලධාරී
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරී
ඒ. එන්. එම්. බී. රසික ප්‍රභාත් - සංවර්ධන නිලධාරී

**පිටු සැකසුම හා නිර්මාණකරණය**
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරී

**ලිපි සහ තොරතුරු සැපයීමෙන් දායකත්වය**
ඩී. පී. ඩබ්ලිව් පොත්තවෙල - තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී
සමන් අමරකෝන් - ප්‍රධාන මෙහෙයුම් නිලධාරී (පැල්වත්ත)
ඒ. එම්. මාලිකා පෙරේරා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
ආචාර්ය ගයානි චංචලා - පර්යේෂණ නිලධාරී
පී. ඒ. ඒ. චතුරංග - පර්යේෂණ නිලධාරී
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරී
ඒ. එන්. එම්. බී. රසික ප්‍රභාත් - සංවර්ධන නිලධාරී

**උක් කර්මාන්තයට අදාළ ලිපි සැපයීමෙන් පුවත් හසුන ඉදිරි කලාපයන් සඳහා ඔබට දායක විය හැකි අතර, එම ලිපි ලේඛන, ඔබගේ අදහස් හා යෝජනා පහත ලිපිනයට යොමු කරන්න.**

සංස්කාරක
පුවත් හසුන
උක් පර්යේෂණ ආයතනය
උඩවලව
ඊ මේල්: puwathhasunasri@gmail.com

**විමසීම්**
අධ්‍යක්ෂ, උක් පර්යේෂණ ආයතනය, උඩවලව
දුරකථන: 047 22 33281, 047 22 33285 ෆැක්ස්: 047 22 33233
ඊ මේල්: puwathhasunasri@gmail.com
වෙබ් අඩවිය: www.sugarres.lk

Follow us on

ප්‍රකාශනය - තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය - උක් පර්යේෂණ ආයතනය